**ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 31 දින දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 විගණන නිරීක්ෂණය**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාරව ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණ ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලැකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනිමට පරිශ්‍රමයක් දක්වා තිබිම | 1. අධි ප්‍රතිපාදන සලසා තිබීම.<br>2. ලේඛන හා පොත් පවත්වා නොතිබිම | 2.5 |
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | අනුකූල නොවීම් | 2.6 |
| 128(1)(ඊ) | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා හෝ භාණ්ඩාගාරය හෝ විසින් ඉල්ලා සිටින තොරතුරු, ප්‍රකාශ හා වාර්තා නිවැරදිව කලට වේලාවට ඉදිරිපත් කරන බව | වාර්ෂික කාර්යසාධන වාර්තාව සභාගත නොකිරිම. | 2.2.2 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව, | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම | 2.4(අ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයන්

(අ) සුළු වැරදිකරුවන් සඳහා ප්‍රජා විශෝධන නියෝග ලබාගැනීම.

(ආ) ආගමික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුළින් ආඥාලාභීන් අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කිරීම.

(ඇ) මනෝ විද්‍යාත්මක උපදේශනය තුළින් ආඥාලාභීන් මානසික ලෙස සංවර්ධනය කිරීම.

(ඈ) වෘත්තීය පුහුණු වැඩසටහන් තුලින් ආඥාලාභීන්ගේ හැකියා වර්ධනය හා ජීවනෝපාය සංවර්ධනය.

(ඉ) විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් ආඥාලාභීන්ගේ හැකියා වර්ධනය සහ ආර්ථික වශයෙන් සංවර්ධනය කිරීම.

(ඊ) වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු කිරීම තුළින් මතට ඇබ්බැහි වූ ආඥාලාභීන් ඉන් මුදවා ගැනීමට කටයුතු කිරීම.

(උ) පෞරුෂත්ව සංවර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(ඌ) රැඳවි පවුල්, වරදට පෙළඹීමට ඉඩ ඇති පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල්, නිදහස්ව පැමිණි රැඳවියන් හා ඔවුන්ගේ පවුල් ආර්ථික, සමාජීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 2.2 කාර්යසාධනය

#### 2.2.1 ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවුරුදු දෙකකට වඩා අඩු අනිවාර්යය නොවන සිර දඬුවන් ලබන වැරදි සඳහා වරදකරුවන් වන තැනැත්තන් හට දඩයක් , බන්ධනාගාර ගත කිරීමක් හෝ අත්හිටවූ සිර දඬුවමක් වෙනුවට ප්‍රජා පාදක විශෝධන ආඥාවක් සඳහා යොමු කිරීමට ප්‍රතිපාදන 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනතින් ලබා දී තිබුණි. තවද අධිකරණ පද්ධතිය තුළින් ප්‍රජා පාදක විශෝධන ආඥා ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව විසින් අධිකරණ සේවා කොමිෂන් සභාව දැනුවත් කර තිබුණු අතර අධිකරණ සේවා කොමිෂන් සභාව මහේස්ත්‍රාත්වරු දැනුවත් කර චක්‍රලේඛ නිකුත් කර තිබුණි. එහෙත් අධිකරණයෙන් ප්‍රජා විශෝධන ආඥා නිකුත් කල හැකි වරදකරුවන්ට වුවද දඩ නියම කිරීම

හෝ බන්ධනාගාර ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී දඬුවම් කාලය වසර 02 කට වඩා අඩු පුද්ගලයන් 21,241 ක් බන්ධනාගාර ගත කර තිබුණි. මෙම රැඳවියන් සමාලෝචිත වර්ෂයේ බන්ධනාගාර ආයතන තුළට ඇතුළත් වූ මුළු රැඳවියන් සංඛ්‍යාවෙන් සියයට 93 ක් වන අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂයේදී දිනකට බන්ධනාගාරය, පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා වැය කර ඇති මුදල රු.14,358,916 ක් වී තිබුණි.

(ආ) බන්ධනාගාරගත වන රැඳවියන් සඳහා ප්‍රජා විශෝධන ආඥා ලබා ගත්තේ නම් බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් රැඳවියන් සඳහා දරනු ලබන පිරිවැය සහ සිර මැදිරි තදබදය අඩුකර ගත හැකිව තිබුණි. තවද ඔවුන් හා ඔවුන්ගේ පවුල් සඳහා ස්වයං රැකියා පුහුණුව, පවුල් සංවර්ධනය, විධිමත් පුනරුත්ථාපන ක්‍රියාවලියක් මගින් එම පුද්ගලයන් සමාජ ගතවීම හේතුවෙන් නැවත නැවත බන්ධනාගාර ගත වන ප්‍රමාණය අඩුවීම, විශෝධන ක්‍රියාවලියෙන් පසුව නිරන්තරයෙන් පසුවිපරම් කටයුතු සිදු වීම නිසා නැවත වැරදි මගට යාමේ ප්‍රවනතාවය අඩුකර ගැනීම ආදි ප්‍රතිලාභ අත්කර ගැනීමට හැකියාව පැවතුණි. ප්‍රජා විශෝධන ආඥා ලබා ගැනීමට නොහැකි වීමෙන් එම ප්‍රතිලාභ අහිමි වී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව විසින් ආඥාලාභීන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් 680 ක් ද, අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් 991 ක් ද සැලසුම් කර තිබුණ ද අධිකරණයෙන් ප්‍රජා විශෝධන ආඥා ප්‍රමාණවත් පරිදි ලබා නොදීම හේතුවෙන් සත්‍ය වශයෙන් ක්‍රියාත්මක කර තිබුණේ පිළිවෙලින් වැඩසටහන් 170 ක් හා 201 ක් පමණි. මේ සඳහා වැයකර ඇති මුදල රු.10,766 ක් වී තිබුණි.

### 2.2.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2018 අගෝස්තු 29 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 2.3 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 88 | 87 | 1 | 1 |
| | මූලධන | 10 | 08 | 2 | 20 |
| | **එකතුව** | **98** | **95** | **03** | **3** |
| 2014 | පුනරාවර්තන | 200 | 162 | 38 | 19 |
| | මූලධන | 13 | - | - | - |
| | **එකතුව** | **213** | **175** | **38** | **17** |
| 2015 | පුනරාවර්තන | 222 | 215 | 07 | 3 |
| | මූලධන | 12 | 12 | - | - |
| | **එකතුව** | **234** | **227** | **07** | **3** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2016 | පුනරාවර්තන | 253 | 250 | 03 | 1 |
| | මූලධන | 13 | 10 | 03 | 25 |
| | **එකතුව** | **266** | **260** | **06** | **2** |
| 2017 | පුනරාවර්තන | 264 | 256 | 08 | 2.87 |
| | මූලධන | 11 | 08 | 03 | 28.20 |
| | **එකතුව** | **275** | **264** | **11** | **3.84** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදනය සලසා තිබීම**

**--------------------------------**

වැය විෂයයන් 08 ක් සඳහා එකතුව රුපියල් මිලියන 6.7 ක අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම වැය විෂයයන්ට අදාල ප්‍රතිපාදනවලින් එකතුව රුපියල් මිලියන 3.8 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**---------------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**-----------------------------------------------**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 32601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 17.00 | 10.65 | 7.00 | 8.19 | 44.00 | 25.81 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

**හිඟ හිටි ණය ශේෂ අයකර නොගැනීම**

**------------------------------------------**

වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ණය ශේෂය රු.131,020 ක් වූ අතර එම හිඟ හිටි ණය ශේෂය වර්ෂ 05 ට වැඩි කාලයක සිට පැවත එමින් තිබුණ ද එම ශේෂය අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අවධානය යොමු කර නොතිබුණි.

## 2.5 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීන කර නොතිබූ බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි.ඒ.අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**2.6 අනුකූල නොවීම්**

**2.6.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 237 (ආ) ප්‍රකාරව භාණ්ඩ ලැබී ඇති බවට සහතික වීමෙන් අනතුරුව ගෙවීම් කළ යුතු වුවත් ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා රු.574,771 ක රාජකාරී ගමන්මළු මිලදී ගැනීමේ දී භාණ්ඩ සැපයීමට පෙර රු.287,385 ක මුදලක් 2017 දෙසැම්බර් 29 දින පෞද්ගලික ආයතනයක් වෙත ගෙවා තිබුණි.

**2.7 අභ්‍යන්තර විගණනය**

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අමාත්‍යාංශයේ විගණන අංශයෙන් හෝ අභ්‍යන්තර විගණනයක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර නොතිබුණි.

**2.8 මානව සම්පත් කළමනාකරණය**

**2.8.1 අනුමත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රුපියල් මිලියන 230 ක් වැය කර තිබුණි.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 04 | 02 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 124 | 108 | 16 |
| (iii) | ද්විතියික මට්ටම | 468 | 398 | 70 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 11 | 06 | 05 |
| | එකතුව | 607 | 514 | 93 |

2017 දෙසැම්බර් 31 දින වන විට අනුමත සේවක සංඛ්‍යාව වූ 607 න් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 93 ක් වී තිබුණි. මේ අතුරින් ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරීන්ගෙන් සියයට 80 ක් හා සංවර්ධන නිලධාරී තනතුරෙන් සියයට 19 ක ප්‍රමාණයක් ද පුරප්පාඩුව පැවතීම නිසා දෙපාර්තමේන්තුවේ පරිපාලනමය කටයුතු සඳහා බාධා වී තිබුණි.